# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 41

# දරන ණය සහනදායක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 41 දරන
ණය සහනදායක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 27/73

**ණය සහනදායක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 41 දරන ණය සහනදායක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** ණය සහනදායක ආඥාපනතේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 81 වන අධිකාරයේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) ඉල්ලීමක් නිෂ්ප්‍රභ කරමින් හෝ සහතිකයක් ප්‍රදානය කරමින් හෝ බේරුම් කිරීමක් අනුමත කරමින් හෝ මණ්ඩලය විසින් නියමයක් කරනු ලැබූ දිනයෙහි සිට තුන් මසක් ඇතුළත නැතහොත් සමථයට පත් කරනු ලැබූ ණය මුදල ගෙවීම අවසාන කරනු ලැබීමට පෙර, මණ්ඩලයේ ම ඕනෑකම පිට හෝ සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් කරනු ලැබූ ඉල්ලීමක් පිට, මණ්ඩලය විසින් කරන ලද යම් නියමයක් සමාලෝචනය කොට මණ්ඩලය සුදුසු ය යි සිතන වෙනත් නියමයක් මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ය. ".

ඊ 00882—9,832 (73/08)

---

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.